දුරකථන / தொலைபேசி / Telephones: 011-2136600, 011-2136650
ලේකම් / செயலாளர் / Secretary: 011-2136602
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2876169, 011-2876181
විද්‍යුත් තැපැල / மின் - அஞ்சல் / E - mail: info@psc.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.psc.gov.lk

# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
# அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
# OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை.
**No. 1200/9, Rajamalwatta Road, Battaramulla**

මගේ අංකය / எனது இல. / My No.
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date

<u>අනිවාර්ය නිවාඩු ගන්වා ඇති වෛද්‍ය එස්.එස්.එම්.ෂාෆි මහතා නැවත සේවයට කැඳවීම සම්බන්ධවයි.</u>

අධිකරණය මගින් ඇප පිට මුදාහැර ඇති වෛද්‍ය එස්.එස්.එම්.ෂාෆි මහතා නැවත සේවයේ පිහිටුවන ලෙස ඔහු විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව වෙත සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්වරයා මගින් කර ඇති ඉල්ලීම පිළිබඳව මේ දක්වා අවසන් තීරණයක් ලබාදී නොමැත.

එම වෛද්‍ය නිලධාරිවරයාට විරුද්ධව එල්ල වී ඇති චෝදනා සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් පවත්වා එහි වාර්තාව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව වෙත ඉදිරිපත් කරන ලෙස සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්වරයාට දන්වා ඇති අතර එම වාර්තාව මෙතෙක් ලැබී නොමැත. එම වාර්තාව සහ වෛද්‍ය එස්.එස්.එම්.ෂාෆි මහතාගේ ඉල්ලීම පිළිබඳව සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්වරයා තම නිර්දේශය ඉදිරිපත් කරන තෙක් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව විසින් මේ සම්බන්ධයෙන් අවසන් තීරණයක් නොගන්නා බව ප්‍රකාශ කරමි.

මෙම කරුණ සම්බන්ධයෙන් මෙයට පටහැනිව විවිධ මාධ්‍යජාලා මගින් සිදුකර ඇති සියලුම ප්‍රකාශයන් අසත්‍ය බවත් එම සියලුම ප්‍රකාශයන් තරයේ ප්‍රතික්ෂේප කරන බවත් දන්වා සිටිමි. එසේම මේ පිළිබඳව අතිගරු ජනාධිපතිතුමා හෝ ජනාධිපති කාර්යාලයේ වෙනත් කිසිදු නිලධාරියෙකු හෝ මෙම කොමිෂන් සභාවෙන් හෝ ඒ යටතේ ඇති සෞඛ්‍ය සේවා කමිටුවෙන් හෝ කිසිදු ආකාරයක විමසීමක් සිදුකර නොමැති බවත් වැඩිදුරටත් ප්‍රකාශ කරමි.

එම්.ඒ.පී.දයා සෙනරත්
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
2020.01.13